අග්‍රාමාත්‍ය කාර්යාලය
பிரதம அமைச்சரின் அலுவலகம்
PRIME MINISTER'S OFFICE

58, ශ්‍රීමත් අර්නස්ට් ද සිල්වා මාවත, කොළඹ 07.
58, ஸ்ரீமத் ஏர்னஸ்ட் த சில்வா மாவத்தை, கொழும்பு 07.
58, Sir Ernest de Silva Mawatha, Colombo 07.
Web : www.pmoffice.gov.lk


මගේ අංකය : PTF/01/Letter- Gen/02
දිනය : 2020.03.27

**සභාපති**
මධ්‍යම පරිසර අධිකාරිය

**දිවයින පුරා පවතින ජල පවිත්‍රාගාරවල සෞඛ්‍යාරක්ෂිත බව තහවුරු කිරීම**

කොරෝනා වෛරසය (COVID – 19) ශ්‍රී ලංකාවෙන් තුරන් කිරීම සඳහා මේ වන විට රජය විසින් ගෙන යනු ලබන ජාතික වැඩපිළිවෙළට සහාය ලබා ගැනීම සඳහා රාජ්‍ය ආයතනවල ක්ෂේත්‍ර රාජකාරී කටයුතුවල යෙදවිය හැකි කාර්ය මණ්ඩලයේ සේවය ලබා ගැනීමට, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 33 වන ව්‍යවස්ථාව මඟින් අතිගරු ජනාධිපතිතුමා වෙත පැවරී ඇති බලතල අනුව නිකුත් කරන ලද අංක 2168/8 හා 2020 මාර්තු 26 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මඟින් ප්‍රකාශයට පත් කොට ඇති ජනාධිපති විධානය ප්‍රකාරව පත් කරන ලද ජනාධිපති කාර්ය සාධක බලකාය විසින් තීරණය කරනු ලැබ ඇත.

02. ඒ අනුව, දැනට පවතින ව්‍යසනකාරී තත්ත්වය පහව යන තුරු, මහජනතාවට අත්‍යවශ්‍ය පානීය ජලය සපයන, දිවයින පුරා ස්ථාපිත සියලු ජල පවිත්‍රාගාරවල කටයුතු අධීක්ෂණය සඳහා මධ්‍යම පරිසර අධිකාරියේ සේවයේ නියුතු ක්ෂේත්‍ර රාජකාරී කටයුතු සඳහා යෙදවිය හැකි, ජ්‍යෙෂ්ඨ මට්ටමේ නිලධාරීන් අනුයුක්ත කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලෙස කාරුණිකව දන්වා සිටිමි. එම නිලධාරීන් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ අධීක්ෂණය යටතේ රාජකාරී කළ යුතු ය.

03. මේ සම්බන්ධයෙන් ඔබ දක්වන සහයෝගය ඉතා අගය කොට සලකමි.

**ඇන්ටන් පෙරේරා**
අග්‍රාමාත්‍ය අතිරේක ලේකම්
ලේකම් - අත්‍යවශ්‍ය මහජන සේවාවන් අඛණ්ඩව සැපයීම මෙහෙයවීම,
සම්බන්ධීකරණය හා පසුවිපරම් කිරීම පිණිස වූ ජනාධිපති කාර්ය සාධක බලකාය

පිටපත්:

01. ලේකම්, නාගරික සංවර්ධන, ජල සම්පාදන සහ නිවාස පහසුකම් අමාත්‍යාංශය
02. සභාපති , ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය

} කාරුණික දැන ගැනීම සඳහා සහ අවශ්‍ය කටයුතු සඳහා


දුරකථන / தொலைபேசி / Telephones: 2575317 - 18, 2370737 - 38
ෆැක්ස් / தொலைநகல் / Fax: 2575310, 2574713
විද්‍යුත් තැපැල / மின்னஞ்சல் / E-mail: secpm@pmoffice.gov.lk, Info@pmoffice.gov.lk